2023.06.08

සභාපති,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
අංක 36,
මළලසේකර මාවත,
කොළඹ 7.

**<u>කොළඹ මහ නගර සභාවේ හිටපු නගරාධිපතිනිය රෝසි සේනානායක මහත්මිය සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වන ලෙස කරනු ලබන ඉල්ලීමයි.</u>**

කොළඹ මහ නගර සභාවේ හිටපු නගරාධිපතිනිය වන රෝසි සේනානායක මහත්මිය කොළඹ මහ නගර සභාවේ නගරාධිපති නිල නිවස 2018 - 2023 දක්වා භාවිතා කර ඇත. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු යටතේ විමර්ශනයක් පවත්වන ලෙස මෙමගින් ඉල්ලා සිටියි.

1. එකී නිල නිවසසේ මුළු සේවා කාල පරිච්ඡේදය තුළ විදුලි බිල්පත් ගාස්තුවේ මුළු එකතුව රුපියල් 9,043,553.00 කි. සාමාන්‍යයක් වශයෙන් ගත් කල රුපියල් 200.000 මාසිකව ඉක්මවන විදුලි බිල් පතක් ලැබෙන ලෙස කොළඹ මහ නගර සභාවේ නගරාධිපති නිල නිවසේ විදුලිය පරිභෝජනය කර ඇත්තේ කෙසේද?

2. එකී නිල නිවස පවිත්‍ර කිරීමේ කටයුතු සඳහා නගර සභාවේ සේවකයින් නොවන සේවකයින් සපයන පෞද්ගලික ආයතනයකින් මුල් අවස්ථාවේදී සේවකයින් 8 නෙක් ද 2021 පෙබරවාරි 16 සිට සේවකයින් 9 යක් වශයෙන් පවිත්‍රා කටයුතු වශයෙන් සේවකයින් යොදා ගෙන ඇති අතර ඉහත කී කාලය තුළ එම සේවය වෙනුවෙන් රුපියල් 15,107,894.20 ක් ගෙවා ඇත.

ඊට අමතරව එම නිල නිවස ඉදිරිපිට ගෙමිදුල පිරිසිදු කිරීමේ කටයුතු සඳහා විහාර මහා දේවී උද්‍යානයේ සේවකයින් තිදෙනෙක් යොදා ඇති අතර තිදෙනාට රුපියල් 909,000.00 ක් ගෙවා ඇත.

කොළඹ මහ නගර සභාවේ නිසි ක්‍රියා පටිපාටි හා එම පිළිවෙත් අනුව නගරාධිපති නිලනිවස සඳහා මුළු සේවකයින් සංඛ්‍යාව 4 ක් පමණ භාවිතා කර හැකි අවස්ථාවක නගර සභාවේ සේවකයින් 3 ක් හා ඊට අමතරව පෞද්ගලික ආයතනයකින් සේවකයින් 9 දෙනා බැගින් මුළු සේවකයින් 12 දෙනෙක් පවිත්‍රා කටයුතු සඳහා යොදවා මුදල් ගෙවා ඇත්තේ කෙසේද?

එනම් රජයේ මුදල් අවභාවිත කරමින් හෝ වෙනත් පාර්ශ්වයක් වෙත වාසි ලැබෙන ආකාරයට කටයුතු කරමි ඔබ කොමිෂන් සභාවේ පිහිටුවා ඇති 1994 අංක19 දරන (සංශෝධිත) පනතේ 70 වගන්තිය සඳහන් දූෂණය නැමැති වරද සංයුක්ත වන ආකාරයෙන් කටයුතු කර තිබේ ද, යන්න සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වන මෙන් මෙයින් ඉල්ලා සිටිමි

එමෙන්ම මෙම පැමිණිල්ල මත පදනම්ව ඇයට එරෙහිව පවත්වනු ලබන විමර්ශනයේදී ඔබ කොමිෂන් සභාවේ විෂය පථයට ගැනෙන වරදක් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය වන්නේ නම් ඇයට එරෙහිව ගත හැකි උපරිම නීතිමය ක්‍රියාමාර්ග ගන්නා මෙන් සමස්ත ලංකාවාසී ජනතාව වෙනුවෙන් අප ඉල්ලා සිටින්නෙමු.